කාර්මික තාක්ෂණ ආයතනය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කාර්මික තාක්ෂණ ආයතනයේ (''ආයතනය'') 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 48 ඡේදය ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවද රු.35,394,704 ක් වූ ගෙවිය යුතු ශේෂ ණයගැතියන්ට හිලව් කර තිබූ අතර රු.1,398,218 ක් වූ විවිධ ණයහිමි ශේෂයට විවිධ ණයගැතියන් හිලව් කර දක්වා තිබුණි. මේ හේතුවෙන් ජංගම වත්කම් හා ජංගම වගකීම් රු.36,792,922 කින් අඩුවෙන් දක්වා තිබුණි.	මෙම ශේෂ, ණයගැති හා අත්තිකාරම් ලැබීම් ශේෂයන් වන අතර හිලව් කිරීමක් කර නොමැත. ගිණුම් සටහන් අංක 18 A හා 18 B මඟින් මෙම අගයන් දක්වා ඇත. සමාලෝචිත වර්ෂයේ ණයගැති ශේෂවල අගය නිවැරදිව දක්වා ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව වත්කම් හා වගකීම් හිලව් නොකර වෙන්වෙන්ව දැක්විය යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 හි 31 ඡේදය ප්‍රකාරව මූල්‍ය අයිතමයන්ගෙන් පැනනගින විනිමය වෙනස එය ඇති වූ කාලපරිච්ඡේදයට අදාළ අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගත යුතු වුවත් රු.7,333,133 ක් වූ ඩොලර් ඉතුරුම් ගිණුමේ හුවමාරු අලාභය සමාලෝචිත වර්ෂයේ වෙනත් මෙහෙයුම් ආදායමෙන් අඩු කර දක්වා තිබීම හේතුවෙන් ආදායම් හා වියදම් සමාන ප්‍රමාණයකින් අඩුවෙන් දක්වා තිබුණි.	ප්‍රමිති ප්‍රකාරව නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිති ප්‍රකාරව මූල්‍ය අයිතමයන්ගෙන් පැනනගින විනිමය වෙනස එය ඇති වූ කාලපරිච්ඡේදයට අදාළ අතිරික්තයට හෝ ඌනතාවයට හඳුනාගත යුතුය.
(ඇ)	යුරෝ මුදල්වලින් ගණුදෙනු කරන තැන්පතු ගිණුමේ සමාලෝචිත වර්ෂය අවසානයට පැවති යුරෝ 76,655 ක ශේෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ	අතපසු වීමකින් මෙම අගය ගිණුම් ගතකොට ඇත.	ප්‍රමිති ප්‍රකාරව විදේශ මුදලින් ගණුදෙනු කරන තැන්පතු ගිණුම්

	ගිණුම්කරණ ප්‍රමිති අංක 05 හි 43(අ) ඡේදය ප්‍රකාරව එදිනට පැවති හුවමාරු වටිනාකමට අගය කිරීම වෙනුවට ගණුදෙනු සිදුවන අවස්ථාවේ හුවමාරු වටිනාකමට දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම රු.2,599,041 කින් වැඩියෙන් දක්වා තිබුණි.		වල පවතින ශේෂය සමාලෝචිත වර්ෂය අවසානයට පවතින හුවමාරු වටිනාකමට අගය කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 39 සිට 43 දක්වා වූ ඡේද ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට හඳුනා නොගෙන හෙළිදරව් කළ යුතු වේ. එසේ වුවද ආයතනය සමඟ වූ බැඳුම්කර පැහැරහැර ඇති නිලධාරීන් 20 දෙනෙකුගෙන් අයවිය යුතු රු.13,674,801 ක් ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්ගතකර තිබුණි. තවද ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් අයකල රු.8,474,545 ක මුදලක් භාණ්ඩාගාරය වෙත නොයවා Staff Activity Fund නම් වූ අරමුදලකට බැර කර තිබුණි.	මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ශේෂ ලෙස හා ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමේ ගිණුමක් ද පෙන්වූ අතර ඉදිරියේදී ප්‍රමිති ප්‍රකාරව හෙළිදරව් කිරීමට කටයුතු කරන බවත් ගිවිසුම් කඩකළ නිලධාරීන්ගෙන් ලද මුදල් නිවැරදිව ගිණුම් තැබීමටත් කටයුතු කරනු ලැබේ.	ප්‍රමිති ප්‍රකාරව අසම්භාව්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස හඳුනා නොගෙන හෙළිදරව් කළ යුතුය. තවද ගිවිසුම් කඩකිරීම වෙනුවෙන් අයකල මුදල් භාණ්ඩාගාරය වෙත යැවිය යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 10 හි පරිශිෂ්ඨයේ දැක්වෙන ක්‍රියාත්මක කිරීමේ මඟපෙන්වීම් 8 අනුව විද්‍යාත්මක හා තාක්ෂණික ව්‍යාපෘතිවල නිමි තත්ත්වය සැළකිල්ලට ගෙන අයහාර හඳුනාගත යුතු වුවද ඒ අනුව කටයුතු නොකර එවැනි ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද රු.34,802,114 ක් වූ පිරිවැය කෙරීගෙන යන වැඩ ලෙස වත්කම් යටතේ හඳුනාගෙන තිබුණි.	ප්‍රමිති ප්‍රකාරව පර්යේෂණ ව්‍යාපෘති වල නිමි තත්ත්වය අයහාර ලෙස හඳුනාගෙන ගිණුම් තැබීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිති ප්‍රකාරව සම්පූර්ණයෙන් නිම නොවූ විද්‍යාත්මක හා තාක්ෂණික ව්‍යාපෘතිවල නිමි තත්ත්වය සැළකිල්ලට ගෙන අයහාරය හඳුනාගත යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන රු.94,000,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 11 ප්‍රකාරව හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා නොගෙන සමුච්චිත අරමුදලට එකතුකර දක්වා තිබුණි.	ප්‍රමිතිය ප්‍රකාරව වත්කම් පූරණය කළ අගය පමණක් ආදායමට ගැළපිය යුතු අතර ඒ අනුව සමාලෝචිත වසරේදී ප්‍රාග්ධන ප්‍රදාන මඟින් පූරණය කළ අගය සටහන් අංක 5A1 මඟින් ආදායමට ගළපා ඇත.	ප්‍රමිති ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද ආදායමක් ලෙස හඳුනා ගත යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආයතනයේ එක් එක් අංශ අතර සේවා සැපයීමට අදාළව රු.3,842,254 ක් ආදායම් ලෙස හා ඊට අදාළ පිරිවැය වියදම් ලෙස හඳුනාගෙන තිබුණ ද මේ සම්බන්ධයෙන් වූ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	මෙම වටිනාකම ආයතනයේ එක් එක් අංශ අතර සේවා සපයා ගැනීම තුළින් හඳුනාගත් අගයන් වන අතර ලාභය වැඩිවීමක් සිදු නොවේ.	ආයතනයේ එක් එක් අංශ අතර සේවා සැපයීමට අදාළව ආදායම් හා වියදම් හඳුනාගැනීමට අදාළ ගිණුම්කරණ ප්‍රමිතිය සමඟ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය.
(ආ)	ස්ථාවර තැන්පතු 14 ක් හා අනෙකුත් තැන්පතු 02 ක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ රු.30,038,526 ක පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවල රු.28,122,739 ක් ලෙස රු.1,915,787 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. තවද උක්ත ස්ථාවර තැන්පතු 14 ට අදාළ සමාලෝචිත වර්ෂය අවසානයේ ලැබිය යුතු පොලී ආදායම රු.5,485,684 ක් වුවද එම ශේෂය රු.19,157,057 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.13,671,373 ක් වැඩියෙන් දක්වා තිබුණි. යූරෝ ඉතුරුම් තැන්පතු ගිණුමේ පැවති රු.26,434,499 ක ශේෂය හා රු.30,000,000 ක ස්ථාවර තැන්පතුවක් සඳහා වර්ෂයට අදාළ පොලී ආදායම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.	මේ පිළිබඳ පරීක්ෂා කර අවශ්‍ය වන ගැළපීම් නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	පොලී ආදායම නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්විය යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂය අවසානයේ රු.10,825,952 ක් වූ හඳුනා නොගත් බැංකු සෘජු තැන්පතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කරනු වෙනුවට උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	සෘජු බැංකුගත කිරීම් හඳුනාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කර ඇති අතර බැංකුවද දැනුවත් කිරීමට කටයුතු කර ඇත.	2012 වර්ෂයේ සිට පැවත එන මෙම හඳුනානොගත් සෘජු බැංකු තැන්පතු හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරිමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

(ඇ)	අපහරණයට නියමිත එහෙත් මේ දක්වා අපහරණය නොකළ පිරිවැය එකතුව රු.48,471,163 ක් වූ දේපළ පිරියත හා උපකරණ හා ඊට අදාළ ක්ෂය වෙන්කිරීම් එකතුව රු.47,603,778 ක් ගිණුම්වලින් ඉවත් කර තිබූ අතර මේ හේතුවෙන් රු.867,385 ක් දේපළ පිරියත හා උපකරණ ශුද්ධ අගය අඩුවෙන් දැක්වුණි.	ඉදිරියේදී අපහරණ කටයුතු අවසන් කර නිවැරදිව ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	නිසි පරිදි අපහරණය කරන තෙක් ස්ථාවර වත්කම් හා ක්ෂය වෙන්කිරීම් ගිණුම්වලින් ඉවත් නොකළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ලැබිය යුතු ශේෂ තුළ වසර 03ත් 17ත් අතර කාලයක් තිස්සේ අයනොවී පවතින එකතුව රු.40,476,583ක් වූ විවිධ ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂයේදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	විද්‍යා හා තාක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය කුලී පදනම මත කාර්මික තාක්ෂණ ආයතනයේ සිටි කාලයට ආදාළව ලැබිය යුතු කුලියක් වන අතර මෙය ලබා දෙන ලෙස කිහිප විටක්ම ඉල්ලීම් කර ඇත. කළමනාකරණ තොරතුරු පද්ධතිය, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ඔක්සිජන් හවුස් , WHT Tax, VAT WHT යන අයිතම වසර 10 කට පෙර සිට පැවතෙන ශේෂයන් වන අතර මෙම ශේෂ අයකරගැනීම අසීරු වී ඇත.	දිගුකාලයක් තිස්සේ පැවත එන ශේෂයන් අයකර ගැනීමට නීතිමය කටයුතු සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ආ)	ආයතනයේ සුබ සාධක සංගමය වෙත ලබාදුන් රු.1,003,250 ක ණය මුදල හා 2020 වර්ෂයේ දී රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ලබාදී තිබුණු අත් පිරිසිදුකාරක ද්‍රව්‍ය වල වටිනාකම රු.11,415,309 ක් අයකර ගැනීමකින් තොරව සියයට සියයක් අඩමාන ණය වෙන්කර තිබුණි.	සුබ සාධක සංගමයට ලබාදී ඇති ණය මුදලෙන් කොටසක් මේ වසරේදී ගෙවීමට කටයුතු කරන බව දන්වන ලදී. රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාව වෙත ලබාදී තිබුණු අත් පිරිසිදුකාරක ද්‍රව්‍යවල වටිනාකම රු.11,415,309 ක් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	ලැබිය යුතු මුදල් අය කර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 සිට 2021 දක්වා වූ කාලපරිච්ඡේදයට අයත් ඉදිකිරීම් හා විවිධ ව්‍යාපෘති ඉටු කිරිම වෙනුවෙන් වූ රඳවාගැනීම් රු.8,821,486 ක් සහ වර්ෂ 02 සිට 12 දක්වා කාලයක් පවතින රු.7,001,990 ක් වූ ගෙවිය යුතු ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර නොතිබුණි.	මෙම රඳවා ගැනීම්වලින් රු.5,159,873 ක් අභ්‍යන්තර විගණන වාර්තා හේතුවෙන් රඳවාගෙන ඇත. ඉතිරිය මෙම වසරේදී නිරවුල් කරනු ලැබේ. Refund customer over payment, 2015 VAT Over payment, මෙම ශේෂ VAT බදු ප්‍රතිශත වෙනස් වන අවස්ථාවලදී ලද බදු මුදල් වන අතර එසේ ලැබුණු සියලුම අගයන් අදාළ පාරිභෝගිකයන්ගේ ඉල්ලීම මත නැවත ගෙවීම සඳහා මෙසේ වෙන් කිරීම් කර ඇත.	දිගු කාලයක් තිස්සේ පවතින මෙම ගෙවිය යුතු ශේෂ නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 අංක 17 දරන දේශීය ආදායම් බදු පනතේ 9(i) වගන්තිය	ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2023/24 වසරට අදාළව කාර්මික තාක්ෂණ ආයතනය අදායම් බදු සඳහා ලියාපදිංචි කර ඇති අතර ඒ සඳහා කටයුතු කිරීමට සැලසුම් කර ඇත.	ආදායම් බදු ලියා පදිංචි වීමට හෝ බදු නිදහස් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය.
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වන වගන්තිය	ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර 2024 අප්‍රේල් මාසයේ සිට පුරප්පාඩුව පැවතුණි.	බඳවා ගැනීම් සිදු කිරීමට අනුමැතිය ලද වහාම අදාළ බඳවා ගැනීම සිදුකරනු ලැබේ.	පුරප්පාඩු තනතුර සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවාගැනීමට වහාම කටයුතු කළ යුතුය.
(ඇ) (i)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5)	2024, 2023 හා ඊට පෙර වර්ෂ වලදී සැපයුම්කරුවන් වෙත ලබා දී තිබුණු එකතුව රු.17,618,815 ක් වූ අත්තිකාරම් පියවීම් සිදුකර නොතිබුණි.අග්‍රිම නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දින හෝ ඊට පෙර පියවීම සිදුකළ යුතු	කඩිනමින් අග්‍රිම පියවා ගැනීමට අවශ්‍ය සෑම පියවරක් ම ගැනීමට කටයුතු කරනු ලැබේ.	කාර්යය අවසන් වූ පසු අත්තිකාරම් පියවීමද කඩිනමින් සිදු කළ යුතුය. තවද මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂ අවසානයට සියලු අග්‍රිම පියවා ගැනිමට කටයුතු කළ යුතුය.

		නමුත් ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට නොපියවූ රු.2,521,914 ක අතුරු අග්‍රිම ශේෂයක් පැවතුණි.		
(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 756 (6)	2023 හා 2024 වර්ෂවලට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2023 වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර 2024 වාර්තාව සකස් කරමින් පවතී. එය කඩිනමින් ලබාදීමට කටයුතු කරමින් පවතී.	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදුකර වාර්තා විගණකාධිපති වෙත නියමිත කාල රාමුව තුළ ලබාදීමට කටයුතු කළ යුතුය.
(ඈ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය සංග්‍රහයේ 5.4.4 වගන්තිය	වටිනාකමින් සියයට 20 ක මුදලක් පමණක් අත්තිකාරම් ලෙස ගෙවිය යුතු වුවත් දේශීය මිලදී ගැනීම්වල සැපයුම්කරුවන් වෙත මුළු වටිනාකම අත්තිකාරම් ලෙස ගෙවීම් කර තිබුණි.	මින් බොහොමයක් සඳහා භාණ්ඩ ලැබී හෝ සේවා සපයා ඇති අතර GRN පත් පිළියෙළ කිරීමට ඇති යම් ප්‍රමාදයන් හේතුවෙන් මෙම තත්වය ඇතිව ඇත. කෙසේ නමුදු ඉදිරියේදි අත්තිකාරම් ලබාදීම හා මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුව වටිනාකමින් සියයට 20 ක් සඳහා පමණක් අත්තිකාරම් ලබාදිය යුතුය.
(ඉ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත් පොතෙහි			
(i)	3.2 වගන්තිය	සමාලෝචිත වර්ෂයේ ඉතිරි කරගත් නිවාඩු සඳහා එකතුව රු.10,842,115 ක් 2025 වර්ෂයේදී ගෙවා තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	කළමනාකාරීත්වය අදහස් දක්වා නොමැත.	චක්‍රලේඛ උපදෙස් පරිදි භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මෙවැනි දීමනා ගෙවිය යුතුය. විධිමත් අනුමැතිය රහිතව ගෙවූ දීමනා අය කරගැනීමට කටයුතු කළ යුතුය.

(ii)	6.6 වගන්තිය	මුදල් වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුළත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් ආයතනය විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පත විගණිත දිනය වු 2025 ජුනි 16 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. 2022 හා 2023 වර්ෂවලට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදී වාර්ෂික වාර්තාවේ කෙටුම්පත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව හා 2022 හා 2023 වර්ෂවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කටයුතු කරමින් පවතී.	චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයට අදාළව කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කළයුතු අතර පසුගිය වසරවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2024 දෙසැම්බර් 23 දිනැති අංක PED/03/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 01 වගන්තිය	2023 වර්ෂය තුළ උපයා ඇති ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට ලාභාංශ/ අයබදු ලෙස ගෙවා නොමැති ආයතන ලාභදායිත්වය මත පදනම්ව කාර්ය මණ්ඩලය වෙත ප්‍රසාද දීමනා ගෙවීමට හිමිකම් නොලැබුවද ඒ අනුව කටයුතු නොකර ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රසාද දීමනා, දිරි දීමනා හා නිවාඩු දීමනා ලෙස රු.35,210,816 ක් ගෙවා තිබුණි.	කළමනාකාරිත්වය අදහස් දක්වා නොමැත.	චක්‍රලේඛ ප්‍රකාරව ඒකාබද්ධ අරමුදලට නියමිත බැර කිරීම් සිදු කර නොමැති බැවින් ප්‍රසාද දීමනා ලබා ගැනීමේ හිමිකමක් නොමැති අතර ප්‍රසාද දීමනා නොගෙවිය යුතුය.

2 මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.81,056,338 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.92,240,946 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,184,608ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රමිති සේවා ආදායම, උපදේශන සේවා ආදායම, ගිවිසුම් ගත ව්‍යාපෘති ආදායම හා පුනරාවර්තන ලැබීම් එකතු වටිනාකම රු.40,649,823 කින් වැඩිවීමට සාපේක්ෂව පුද්ගලික

පඩිනඩි වියදම් ,නඩත්තු වියදම්, ගිවිසුම් සේවා වියදම් හා ගමන් වියදම් එකතු වටිනාකම රු.74,817,200 කින් වැඩිවීම හා සැපයුම් සේවා වියදම් හා ව්‍යාපෘති වියදම් එකතු වටිනාකම රු.17,482,112 කින් අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංවර්ධිත රටවල උසස් ඖෂධ රසායනාගාරවල පහසුකම් සහිතව ජීඑල්පී (GLP) තත්ත්වය ඇතුළුව ප්‍රතීතනය ලත් අති නවීන ඖෂධ රසායනාගාරයක් භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.99,423,972 ක් වැයකර ආයතනය තුළ ස්ථාපනය කර 2019 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් තිබුණි. එසේ වුවද දිවයිනේ ඇති රෝහල් පද්ධතියද ඇතුලත්ව සියළුම බටහිර ඖෂධ සපයාගැනීමේ හා බෙදා හැරීමේ කාර්යය නියාමනය කරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය සමඟ උක්ත රසායනාගාර සේවාවන් සැපයීම සම්බන්ධව එකඟතාවයක් නොවීම හේතුවෙන් රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූ ශ්‍රී ලංකාව තුළ ඖෂධ අංශයේ සංවර්ධනය සඳහා ස්වාධීන ප්‍රතීතනයලත් තෙවන පාර්ශවීය පරීක්ෂණාගාරයක් ලෙස මෙම රසායනාගාරය මෙතෙක් භාවිතා වී නොතිබුණි. තවද, එහි අපේක්ෂිත අරමුණු අතර වූ ඖෂධ විශ්ලේෂණය සඳහා දේශීයව හා ජාත්‍යන්තරව පිළිගත් විශිෂ්ඨතා මධ්‍යස්ථානයක් බවට පත් කිරීම, ක්ෂේත්‍ර ඖෂධවලට අවශ්‍ය සියලු හෝඩුවාවන් රසායනිකව හා භෞතිකව විශ්ලේෂණය කිරීම, ඖෂධවල ගුණාත්මකභාවය සම්බන්ධයෙන් ජාතික ගැටළු විසඳීම හා ඖෂධවල දේශීය රෙගුලාසි හා මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම මේ දක්වා ඉටු වී නොතිබුණි.	සමාගම් විසින් ආනයනය කරනු ලබන ඖෂධ නිෂ්පාදන පරීක්ෂා කිරීම විධිමත් කිරීම සඳහා රජයේ මඟපෙන්වීම සහ මූල්‍ය අනුග්‍රහය මත පදනම්ව රසායනාගාරය ඖෂධ නිෂ්පාදනවල ගුණාත්මකභාවය පිළිබඳ තුන්වන පාර්ශවයක ස්වාධීන පරීක්ෂණ අනිවාර්ය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය අවශ්‍ය ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදුකරනු ඇතැයි අපේක්ෂාවෙන් රසායනාගාරය ආරම්භ කරන ලදී. ඖෂධ නියාමන අධිකාරිය තෙවන පාර්ශවීය පරීක්ෂණය අනිවාර්ය කර නොමැති බැවින්, ඖෂධ නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් තම නිෂ්පාදන පරීක්ෂා කිරීම සඳහා ITI වෙත නොපැමිණේ.	රසායනාරය පිහිටුවා වසර 05 කට වැඩි කාලයක් ඉක්මගොස් පවතින අතර සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර මෙම රසායනාගාරයෙන් ප්‍රයෝජන ගැනීමට ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට ක්‍රියා මාර්ග ගෙන රසායනාගාරය උපයෝජනය කිරීමට වග බලා ගත යුතුය.

(ආ) 2016 අගෝස්තු 31 දිනැති අමප/16/1576/19/96 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසමේ නියමයන්ට අනුකූලව තුන්වන පාර්ශවීය ඛණිජ තෙල් නිෂ්පාදනවල තත්ත්වය පරීක්ෂා කිරීම පිණිස 2017 - 2020 කාලය තුළ රු.117,776,752 ක් වැයකර ඛණිජ තෙල් හා ලිහිසි තෙල් රසායනාගාරයක් ස්ථාපනය කර අවශ්‍ය උපකරණ මිලදීගෙන තිබුණද ඛණිජ තෙල් නියැදි ලැබීමේ ක්‍රමවේදයක් නිර්මාණය කර නොතිබීම හේතුවෙන් රසායනාගාරය පිහිටුවීමේ මූලික අරමුණ ඉටුව නොතිබුණි.	මෙම රසයනාගාරය සඳහා නියාමන අධිකාරී (Regularity Authority) බලයක් නොමැති බැවින් සියලුම සාම්පල අප රසායනාගාරයට නොලැබේ. මෙම ක්‍රියාවලිය මූලික පරමාර්ථය තුළ පවතින අතර එය ජාතික අවශ්‍යතාවයක් බැවින් ඒ සඳහා බලශක්ති අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ පූර්ණ කැපවීම මත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි හැකි ඉක්මනින් ක්‍රියාවට නැංවීම සඳහා කටයුතු සිදුවෙමින් පවතී.	භාණ්ඩාගාර මුදල් වැයකර රසායනාගාරය ස්ථාපනය කර වසර 5 කට වැඩිකාලයක් ඉක්මවා ඇති අතර මෙම ගැටලුවට සම්බන්ධිත ආයතන සමඟ එකඟතාවයෙන් සාම්පල් ලබා ගැනීමේ ක්‍රමවේද සකස් කර රසායනාගාරය පිහිටුවීමේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට හා රසායනාගාරය උපයෝජනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ) 2020 – 2024 කාලපරිච්ඡේදය තුළ පර්යේෂණ කාර්යයන්හි නියැලෙන නිලධාරීන්ට මූලික වැටුපෙන් සියයට 35 ක් වන පර්යේෂණ දීමනා ලෙස එකතුව රු.100,314,680 ක් ගෙවා තිබුණද, ආයතනය පිහිටුවීමේ මූලික අරමුණ වූ ශ්‍රී ලංකාවේ තාක්ෂණ මට්ටම උසස් කිරීම සඳහා නිෂ්පාදනවල තත්ත්වය, තාක්ෂණික කර්මාන්තවලදී භාවිතා කරන තාක්ෂණ ක්‍රියාවලි හා ක්‍රම වැඩිදියුණු කිරීම සහ කර්මාන්තවලදී භාවිතා කිරීම සඳහා නව ක්‍රියාවලි හා ක්‍රමෝපායන් සොයා ගැනීම පිණිස පර්යේෂණ සිදුකිරීම වේගවත් කිරීමට හා රටට වඩාත් ඵලදායී තාක්ෂණ දායකත්වයක් ලබාදීමට හැකි පර්යේෂණ හඳුනාගැනීම කෙරෙහි යොමු වී නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කිසිදු රාජ්‍යභාග ආදායමක් ආයතනයට ලැබී නොමැති අතර පසුගිය වර්ෂයේද ලද රාජ්‍යභාග ආදායම රු.580,000 වැනි අඩු මට්ටමක පැවතුණි.	කර්මාන්ත හා රටෙහි ඉල්ලුම මත පදනම්ව පර්යේෂණ හා සංවර්ධන ප්‍රමුඛතා ක්ෂේත්‍ර/තේමාවන් මූලික වශයෙන් තෝරාගනු ලැබේ. 2025 සඳහා පර්යේෂණ හා සංවර්ධන ප්‍රමුඛතා, ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව සකස් කරන ලද කාර්මික තාක්ෂණ ආයතනයේ උපායමාර්ගික සැලැස්ම අනුව තෝරාගනු ලැබේ.	පර්යේෂණ කාර්යයන් හි ගිවිසුම්ගත කාලය තුල ගුණාත්මක හා ඵලදායි නව තාක්ෂණය හඳුන්වාදීම හා එම තාක්ෂණය වෙළඳපොලට හඳුන්වාදීම තුලින් රාජ්‍යභාග ආදායම් වර්ධනය කරගැනීමට මෙන්ම නව පර්යේෂණ තාක්ෂණික සොයා ගැනීම් තුළින් ජාතික ආර්ථිකයට ඵලදායි දායකත්වයක් ලබා දිය හැකි තත්ත්වයක් ඇති කළ යුතුය.

(ඇ)	ආයතනය 2021 වර්ෂයේ ආරම්භ කර 2023 හා 2024 වර්ෂයන් හි අවසන් කළයුතු පිරිවැය එකතුව රු.60,135,000 ක් වූ පර්යේෂණ ව්‍යාපෘති 23 ක් අවසන් කර නොතිබුණ අතර 2025 ජූනි 30 වනවිට ගිවිසුම්ගත කාලය ඉක්මවා වසර 01 ත් 03 ත් අතර කාලයක් ගතවී තිබුණි. ඉන් ව්‍යාපෘති 16 ක කාලය දීර්ඝ කර තිබුණ ද ව්‍යාපෘති 05 ක් සඳහා දීර්ඝ කළ කාලය ද අවසන් වී මාස 03 ත් 13 ත් අතර කාලයක් ගත වී තිබුණි.	පර්ෂයේෂණ ව්‍යාපෘතිවල ගිවිසුම්ගත කාලය තුළ නිම කිරීම සඳහා පර්යේෂකයන්ට උපදෙස් ලබාදෙන ලදී.	භාණ්ඩාගාර ප්‍රදාන ඵලදායි ලෙස ප්‍රයෝජනයට ගැනීමටත් සැලසුම් පරිදි පර්යේෂණ ව්‍යාපෘති ගිවිසුම් ගත නියමිත කාලයට නිම කරවා ගැනීමටත් අවසන් වාර්තා නියමිත දිනට ලබාගැනීමටත් හැකිවන පරිදි අදාළ නීතිරීති හා පාලන ක්‍රමවේද ඇති කිරිමටත් කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අත් පිරිසිදුකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේදී භාවිතා කළ හැකිව තිබූ රු.7,910,360 ක් වූ එතනෝල් තොගයක් ආයතනය විසින් භාවිතා නොකර වර්ෂය පුරා නිෂ්කාර්යව පැවතුණි.	2020/2021 වසරවල පැවති කොවිඩ් තත්වය හමුවේ අත් සේදුම් කාරක සඳහා එතනෝල් භාවිතා කළ අතර වර්තමානයේදී ඒ සඳහා ඇති අඩු ඉල්ලුම මත අදාළ නිෂ්පාදන සිදු නොකරයි. එහෙත් මෙම එතනෝල් භාවිතා කර BIO DIESEL සහ සේදුම්කරක ද්‍රාවන සැකසීමට කටයුතු කරනු ලැබේ.	මෙම තොගය කල් ඉකුත්වීමට පෙර භාවිතයට ගැනීමට හෝ වෙනත් සුදුසු පියවරක් ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ආයතනයේ වාර්ෂික ඩීසල් පාරිභෝජනයේ වටිනාකම රු.319,637 ක් ව තිබියදී ඉන්ධන හිඟයට පිළියමක් ලෙස ඉන්ධන තොග පවත්වා ගැනීමට ගත් තීරණය මත 2022 වර්ෂයේ මිලට ගත් රු.2,316,281 ක් වූ ඩීසල් ලීටර් 7,177 ක තොගයක් ආයතන පරිශ්‍රය තුළ ලීටර් 8000 ක ධාරිතාවයකින් යුක්ත ටැංකි 02 ක ගබඩාකර පැවතුණි.	මේ වනවිට ආයතනයේ ඩිසල් මඟින් ධාවනය වන වාහන සඳහා මෙයින් ඉන්ධන ලබාගැනීමට කටයුතු කරනු ලැබේ.	ආයතනයේ අවශ්‍යතාවය මත ඉන්ධන සුරක්ෂිත තොග පවත්වාගෙන යායුතු අතර අනවශ්‍ය පරිදි තොග රැස් කිරීමත් නොකළ යුතුය.

(ඈ)	මාලඹේ පිහිටි ඖෂධ තාක්ෂණ අංශය (Herbal Technology Section) තුළ ඇති පරීක්ෂණ සේවාවන් සැපයීම සඳහා යොදාගනු ලබන රු.2,202,614 ක් වටිනා යන්ත්‍රෝපකරණ 04 ක් 2019 වර්ෂයේ සිට අක්‍රීයව පැවැති අතර විගණිත දිනය වූ 2025 ජුනි 20 දින වන විටත් අලුත්වැඩියාකර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම උපකරණ අලුත්වැඩියා කිරීමේ පිරිවැය අධික වන අතර එලෙස අලුත්වැඩියා කළ ද අවශ්‍ය කර්යක්ෂමතාව නොලැබෙන බැවින් අපහරණ කිරීමට කටයුතු කරනු ලැබේ.	අක්‍රීයව පවතින යන්ත්‍ර කඩිනමින් නිසි පරිදි අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනිම කළ යුතුය. එසේ නොහැකි නම් පමණක් අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.